මුදල්, ආර්ථික සහ ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍යාංශය
நிதி, பொருளாதாரம் மற்றும் கொள்கை அபிவிருத்தி அமைச்சு
MINISTRY OF FINANCE, ECONOMY AND POLICY DEVELOPMENT

මහලේකම් කාර්යාලය, කොළඹ 01, ශ්‍රී ලංකාව.
செயலகம், கொழும்பு 01, இலங்கை.
The Secretariat, Colombo 01, Sri Lanka.

කාර්යාලය / அலுவலகம் / Office: 011 2484500, 011 2484600, 011 2484700
ෆැක්ස් / தொலைநகல் / Fax: 011 2449823
වෙබ් අඩවිය / இணைய தளம் / Website: www.treasury.gov.lk

මගේ අංකය / எனது இல / My No: TOD/CFM/1/OB/2020
ඔබේ අංකය / உமது இல / Your No:
දිනය / திகதி / Date: 2020.06.29

භාණ්ඩාගාර මෙහෙයුම් චක්‍රලේඛ අංක : 01/2020

සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන් සහ
දෙපාර්තමේන්තු ප්‍රධානීන් වෙත

**ඉදිකිරීම් ක්ෂේත්‍රයේ සහ අනෙකුත් ක්ෂේත්‍රවල රජයේ කොන්ත්‍රාත්කරුවන් / සැපයුම්කරුවන් වෙත ආර්ථික පුනර්ජීවන සහාය සඳහා පහසුකම් සැලසීම**

ඉදිකිරීම් ක්ෂේත්‍රයේ සහ අනෙකුත් ක්ෂේත්‍රවල රජයේ කොන්ත්‍රාත්කරුවන් / සැපයුම්කරුවන් වෙත "ආර්ථික පුනර්ජීවන සහාය සඳහා පහසුකම් සැලසීම" මැයෙන් 2020 ජුනි 03 දිනැතිව අමාත්‍ය මණ්ඩලය විසින් ගන්නා ලද තීරණය කෙරෙහි ඔබේ අවධානය යොමු කරවමි. ඒ අනුව කොන්ත්‍රාත්කරුවන් / සැපැයුම්කරුවන් වෙත යෝජිත ණය පහසුකම කඩිනමින් බැංකු මගින් ලබා ගැනීමට හැකි වනු පිණිස පහත සඳහන් පියවර අනුගමනය කළ යුතු වේ.

1. 2020 මැයි 31 දිනට ඔබ අමාත්‍යාංශයේ / දෙපාර්තමේන්තුවේ ගිණුම් අංශය වෙත වාර්තා වී ඇති 2019 සහ 2020 වර්ෂයන්ට අදාළ සියළුම හිඟ බිල්පත් ප්‍රමාණය හඳුනා ගෙන ඇමුණුම 1 ආකෘතිය පරිදි නිවැරදිව සම්පූර්ණ කර භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව වෙත 2020 ජූලි 06 දින හෝ එදිනට පෙර pathirana.ppc@tod.treasury.gov.lk ලිපිනය වෙත විද්‍යුත් තැපෑලෙන් එවීමට කටයුතු කළ යුතු ය.

   ඉහත හිඟ බිල්පත් හඳුනා ගැනීමේ ක්‍රියාවලියේ දී වියදම් දරනු ලබන ඒකකය ( Spending Unit) මේ දක්වා යම් කොන්ත්‍රාත්කරුවෙකු/සැපයුම්කරුවෙකුගේ ඉල්ලීම මත යම් බැංකුවක් වෙත බිල්පත් වට්ටම් (Discounted bills) කිරීම සඳහා එකඟවී ඇත්නම් එම බිල්පත් වටිනාකම ඇමුණුම 1 ට ඇතුලත් නොකිරීමට ඔබ විසින් වග බලා ගත යුතුවේ.

2. භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව විසින් එසේ ලබා ගන්නා ලද විස්තර, මීට පෙර භාණ්ඩාගාරය වෙත වාර්තා කර ඇති හිඟ බිල්පත් වටිනාකම් සමග සංසන්දනය කිරීමෙන් අනතුරුව නිකුත් කළ හැකි උපරිම මුදල පිළිබඳ තහවුරුවක් ඔබ වෙත ලබාදීමට වහාම කටයුතු කරනු ලැබේ.

3. මෙම ණය පහසුකම ලබා ගැනීමට අපේක්ෂා කරන අදාල කොන්ත්‍රාත්කරුවන් / සැපයුම්කරුවන් වෙත ඔවුන් විසින් නම් කරනු ලබන එක් බලපත්‍රලාභී වාණිජ බැංකුවක් සඳහා පමණක් මෙම ප්‍රතිපහසුකම් ලිපිය ලබා දිය යුතු වේ. එසේ නම් කරනු ලබන බලපත්‍රලාභී වාණිජ බැංකුව වෙත අදාළ බිල්පත් නිරවුල් කිරීම වෙනුවෙන් ගෙවනු ලබන මුදල් බැර කිරීම සඳහා පමණක් කොන්ත්‍රාත්කරු / සැපයුම්කරු නමින් වන "විශේෂිත ගිණුමක් " හඳුනා ගෙන (Designated Bank Account) එම ගිණුම් අංකය ලබා ගත යුතු වේ.

4. ඉහත (2)හි සඳහන් තහවුරුව භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවෙන් ලබා ගත් පසු එසේ පහසුකම් ඉල්ලා සිටින රජයේ කොන්ත්‍රාත්කරුවන් / සැපයුම්කරුවන් වෙත නිකුත් කළ යුතු වන "ඇමුණුම 2" හි සඳහන් ආදර්ශ ආකෘතිය පරිදි "හිඟ බිල්පත් තහවුරු කිරීමේ ලිපි" සකස් කර ඔබ විසින් පෞද්ගලිකවම අත්සන් කර භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව වෙත 2020 ජූලි 31 දිනට හෝ එදිනට පෙර භාර දිය යුතුය.

5. ඔබ විසින් ඉහත 4 ඡේදය පරිදි නිකුත් කරනු ලබන ලිපිය පදනම් කර ගෙන මෙයට අමුණා ඇති ඇමුණුම 3 ආකෘතිය පරිදි සකස් කරන ලද "හිඟ බිල්පත් නිරවුල් කිරීම තහවුරු කිරීමේ ලිපි" මුදල් අමාත්‍යාංශයේ ලේකම්ගේ අත්සනින් ඔබ වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කරනු ලැබේ. එම ලිපි ලද වහාම මුල් පිටපත සහ දෙවන පිටපත කොන්ත්‍රාත්කරු / සැපයුම්කරු වෙත ඔබ විසින් විධිමත් පරිදි භාර දීමට කටයුතු කළ යුතු වේ.

6. 2020 ජූලි 31 දිනෙන් පසුව මෙම පහසුකම ලබා ගැනීම සඳහා කොන්ත්‍රාත්කරුවන් / සැපයුම්කරුවන් විසින් කරනු ලබන ඉල්ලීම් අමාත්‍යාංශය / දෙපාර්තමේන්තුව විසින් භාර නොගත යුතුය.

7. මෙම චක්‍රලේඛයේ "ඇමුණුම 1 සහ 2" හි ඇතුලත් කළ යුතු ශුද්ධ හිඟ බිල්පත් වටිනාකම පහත සඳහන් පරිදි ගණනය කළ යුතු වේ.

(රුපියල්)

| | | |
|---|---|---|
| අදාල අමාත්‍යාංශය විසින් භාණ්ඩාගාරය වෙත වාර්තා කරන ලද කොන්ත්‍රාත්කරු / සැපයුම්කරු වෙත 2020.05.31 දිනට ගෙවිය යුතුව තිබූ හිඟ බිල්පත් වටිනාකම | | xxxx |
| අඩුකළා :- | | |
| i. 2020.05.31 දින සිට මේ දක්වා ඔබ විසින් නිරවුල් කරන ලද බිල්පත් වටිනාකම | xxxx | |
| ii. වට්ටම් කිරීම සඳහා බැංකුව සමග එකගවී ඇති බිල්පත් වටිනාකම | xxxx | |
| iii. එකතු කළ අගය මත බදු (VAT) සහ අනෙකුත් මූලාශ්‍රයේදී ගෙවිය යුතු රජයේ බදු, රඳවා ගැනීම් සහ අනෙකුත් අඩුකිරීම් | xxxx | (xxxx) |
| ශුද්ධ හිඟ බිල්පත් වටිනාකම | | xxxx |

8. ඔබ විසින් වාර්තා කර ඇති හිඟ බිල්පත් නිරවුල් කිරීමට අවශ්‍ය අක්මුදල් භාණ්ඩාගාරය මගින් ඉදිරියේ දී වරින් වර නිදහස් කිරීමට කටයුතු කරනු ලබන අතර එම අරමුදල් භාවිත කරමින් හිඟ බිල්පත් පියවීම සඳහා කරනු ලබන ගෙවීම් කොන්ත්‍රාත්කරු / සැපයුම්කරු විසින් නම් කරන ලද විශේෂිත බැංකු ගිණුමටම පමණක් (Designated Bank Account) ප්‍රේෂණය කිරීමට කටයුතු කළ යුතුය.

9. විදේශීය ණය හා ආධාර මත ක්‍රියාත්මක වන ව්‍යාපෘතිවලට අදාළ හිඟ බිල්පත් (මූල්‍යනය 17 ඇතුළුව) නිරවුල් කිරීම සඳහා මෙම ක්‍රමවේදය අදාළ කර නොගත යුතුය.

10. ඉහත දක්වා ඇති ක්‍රියා පටිපාටිය ගැන තවදුරටත් යම් පැහැදිලි කිරීමක් අවශ්‍ය වන්නේ නම් භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්, ආර්. එම්. ඒ. රත්නායක මහතා (දු: අ: 071- 8321648) හෝ අතිරේක අධ්‍යක්ෂ ජනරාල්, දිලිප් සිල්වා මහතා (දු: අ: 071- 4441020) අමතා ලබා ගත හැක.

එස්. ආර්. ආටිගල
භාණ්ඩාගාර ලේකම්

පිටපත් : 1. ජනාධිපති ලේකම්
2. ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපති
3. විගණකාධිපති
4. අධ්‍යක්ෂ ජනරාල්, ජාතික අයවැය දෙපාර්තමේන්තුව
5. සාමාන්‍යාධිකාරී, ලංකා බැංකුව
6. සාමාන්‍යාධිකාරී, මහජන බැංකුව

අමාත්‍යාංශයේ / දෙපාර්තමේන්තුවේ නම : ………………………………………………………………………

## 2020 මැයි 31 දිනට හිඟ බිල්පත් සම්බන්ධ වාර්තාව

| අනු අංකය | වවුචර් අංකය හා දිනය | සැපයුම්කරුගේ/කොන්ත්‍රාත්කරුගේ නම | 2020 මැයි 31 දිනට හිඟ බිල්පත් ශුද්ධ වටිනාකම | | | | එකතුව (1) + (2) = (3) |
|---|---|---|---|---|---|---|---|
| | | | 2019 (1) | | 2020 (2) | | |
| | | | පුනරාවර්තන | ප්‍රාග්ධන | පුනරාවර්තන | ප්‍රාග්ධන | |
| | | | | | | | |
| | | | | | | | |
| | | | | | | | |
| | | | | | | | |
| | | | | | | | |
| | | | | | | | |
| | | | | | | | |
| | | | | | | | |
| | | | | | | | |
| | | | | | | | |
| | | | | | | | |
| එකතුව | | | | | | | |

ඉහත දක්වා ඇති හිඟ බිල්පත් සම්බන්ධ විස්තර නිවැරදි බැව් සහතික කරමි.

……………………………………………
ප්‍රධාන මූල්‍ය නිලධාරී / ප්‍රධාන ගණකාධිකාරී

……………………………………
ලේකම්

……………………………. අමාත්‍යාංශය

දිනය : ………………

ඇමුණුම - 2

( අදාල අමාත්‍යාංශයේ ලිපි ශීර්ෂය)

දිනය :

ලේකම්

මුදල්, ආර්ථික සහ ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍යාංශය

**<u>හිඟ බිල්පත් වටිනාකම තහවුරු කිරීමේ ලිපිය</u>**

**<u>……………………………………(කොන්ත්‍රාත්කරුගේ නම)</u>**

මෙම අමාත්‍යාංශය වෙත වාර්තා වී ඇති පරිදි 2019 හා 2020 වර්ෂවලට අදාලව 2020.05.31 දිනට ඉහත නම් සඳහන් කොන්ත්‍රාත්කරු වෙත රු. .........................................වටිනාකමක හිඟ බිල්පත්(ශුද්ධ වටිනාකම) ගෙවීමට ඇති බව මින් සහතික කරමි.

භාණ්ඩාගාරය විසින් ඉහත බිල්පත් නිරවුල් කිරීම වෙනුවෙන් මෙම අමාත්‍යාංශය වෙත ඉදිරියේදී ලබා දෙනු ලබන අක්මුදල් භාවිතා කරමින් උක්ත කොන්ත්‍රාත්කරු නමින් වූ .................................... අංක දරණ ..........................බැංකුවේ ....................ශාඛාවේ පවත්වාගෙන යනු ලබන විශේෂිත වූ බැංකු ගිණුම වෙත ප්‍රේෂණය කරමින් උක්ත හිඟ බිල්පත් වටිනාකම නිරවුල් කිරීමට මෙයින් එකඟ වෙමි.

ලේකම්

................................................ අමාත්‍යාංශය

(Treasury Letter Head)

Annexure 3

**Draft** Date:

Manager,

……………… (Name of the Bank)

**Letter of Acceptance of the Payment of Outstanding Bills –………………………….(Name of the Contractor/supplier)**

The outstanding dues as at 31 May 2020 from the Ministry/Department of ……………………… to...........................…………………….………(name of the Contractor/ supplier) amounts to Rupees ………………………… (Rs……………………... .00).

This letter of acceptance is issued to confirm that Treasury will provide necessary funds to settle the above mentioned outstanding bill value through the Ministry/Department of …………………………………..… to the designated bank account no ……..……………. of …………………….......................... (name of the contractor/ supplier) maintained at your bank on or before 31.12.2020.

……………………………

Secretary

Ministry of Finance, Economy and Policy Development

Copies: (i). Secretary, Ministry of ………………….

(ii). ………………. (name of the Contractor/ supplier)